**ශීර්ෂය - 329 තොරතුරු තාක්ෂණ කළමනාකරණ දෙපාර්තමේන්තුව**

## 1. මූල්‍ය ප්‍රකාශන

### 1.1 මතය

ශීර්ෂය - 329 තොරතුරු තාක්ෂණ කළමනාකරණ දෙපාර්තමේන්තුවේ 2022 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්වය පිළිබඳ ප්‍රකාශය, එදිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය කාර්යසාධන ප්‍රකාශය හා මුදල් ප්‍රවාහ ප්‍රකාශවලින් සමන්විත 2022 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ විධිවිධාන සමඟ සංයෝජිතව කියවිය යුතු ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාවේ ඇතුළත් විධිවිධාන ප්‍රකාර මාගේ විධානය යටතේ විගණනය කරන ලදී. 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 11(1) වගන්තිය ප්‍රකාරව තොරතුරු තාක්ෂණ කළමනාකරණ දෙපාර්තමේන්තුවේ මූල්‍ය ප්‍රකාශන පිළිබඳව මාගේ අදහස් දැක්වීම් හා නිරීක්ෂණයන් ඇතුළත් සම්පිණ්ඩන වාර්තාව 2023 මැයි 16 දින ගණන්දීමේ නිලධාරී වෙත නිකුත් කරන ලදී. විගණන පනතේ 11(2) වගන්තිය ප්‍රකාරව දෙපාර්තමේන්තුවට අදාළ වාර්ෂික විස්තරාත්මක කළමනාකරණ විගණන වාර්තාව 2023 ජූනි 30 දින ගණන්දීමේ නිලධාරී වෙත නිකුත් කරන ලදී. ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(6) ව්‍යවස්ථාව සමඟ සංයෝජිතව කියවිය යුතු 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 10 වගන්තිය ප්‍රකාරව මෙම වාර්තාව පාර්ලිමේන්තුව වෙත ඉදිරිපත් කරනු ලැබේ.

මූල්‍ය ප්‍රකාශනවලින් 2022 දෙසැම්බර් 31 දිනට තොරතුරු තාක්ෂණ කළමනාකරණ දෙපාර්තමේන්තුවේ මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය කාර්යසාධනය හා මුදල් ප්‍රවාහය පොදුවේ පිළිගත් ගිණුම්කරණ මූලධර්මවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කරන බව මා දරන්නා වූ මතය වේ.

### 1.2 මතය සඳහා පදනම

ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට (ශ්‍රී.ලං.වි.ප්‍ර) අනුකූලව මා විගණනය සිදු කරන ලදී. මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් වූ මාගේ වගකීම, විගණකගේ වගකීම යන වගන්තියේ තවදුරටත් විස්තර කර ඇත. මාගේ මතය සඳහා පදනමක් සැපයීම උදෙසා මා විසින් ලබා ගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් සහ උචිත බව මාගේ විශ්වාසයයි.

### 1.3 මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ හා ගණන්දීමේ නිලධාරීගේ වගකීම

පොදුවේ පිළිගත් ගිණුම්කරණ මූලධර්මවලට අනුකූලව හා 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 38 වගන්තියේ සඳහන් විධිවිධානවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිඹිබු කෙරෙන පරිදි මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරිම හා වංචා සහ වැරදි හේතුවෙන් ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොරව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකි වනු පිණිස අවශ්‍ය වන අභ්‍යන්තර පාලනය තීරණය කිරීම ගණන්දීමේ නිලධාරීගේ වගකීම වේ.

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 16(1) වගන්තිය ප්‍රකාරව දෙපාර්තමේන්තුව විසින් වාර්ෂික හා කාලීන මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවන පරිදි ස්වකීය ආදායම්, වියදම්, වත්කම් හා බැරකම් පිළිබඳ නිසි පරිදි පොත්පත් හා වාර්තා පවත්වා ගෙන යා යුතුය.

ජාතික විගණන පනතේ 38(1)(ඇ) උප වගන්තිය ප්‍රකාරව දෙපාර්තමේන්තුවේ මූල්‍ය පාලනය සඳහා සඵලදායි අභ්‍යන්තර පාලන පද්ධතියක් සකස් කර පවත්වා ගෙන යනු ලබන බවට ගණන්දීමේ නිලධාරී සහතික විය යුතු අතර එම පද්ධතියේ සඵලදායිත්වය පිළිබඳව කලින් කල සමාලෝචනයක් සිදු කර ඒ අනුව පද්ධතිය ඵලදායි ලෙස කරනගෙන යාමට අවශ්‍ය වෙනස්කම් සිදු කරනු ලැබිය යුතුය.

## 1.4 මූල්‍ය ප්‍රකාශන විගණනය පිළිබඳ විගණකගේ වගකීම

සමස්ථයක් ලෙස මූල්‍ය ප්‍රකාශන, වංචා හා වැරදි නිසා ඇතිවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොර බවට සාධාරණ තහවුරුවක් ලබාදීම සහ මාගේ මතය ඇතුළත් විගණකාධිපති වාර්තාව නිකුත් කිරීම මාගේ අරමුණ වේ. සාධාරණ සහතිකවීම උසස් මට්ටමේ සහතිකවීමක් වන නමුත්, ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනය සිදු කිරීමේදී එය සැම විටම ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් අනාවරණය කරගන්නා බවට වන තහවුරු කිරීමක් නොවනු ඇත. වංචා සහ වැරදි තනි හෝ සාමූහික ලෙස බලපෑම නිසා ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් ඇති විය හැකි අතර, එහි ප්‍රමාණාත්මකභාවය මෙම මූල්‍ය ප්‍රකාශන පදනම් කර ගනිමින් පරිශීලකයන් විසින් ගනු ලබන ආර්ථික තීරණ කෙරෙහි වන බලපෑම මත රඳා පවතී.

ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනයේ කොටසක් ලෙස මා විසින් විගණනයේදී වෘත්තීය විනිශ්චය සහ වෘත්තීය සැකමුසුබවින් යුතුව ක්‍රියාකරන ලදී. මා විසින් තවදුරටත්,

- ප්‍රකාශ කරන ලද විගණන මතයට පදනමක් සපයා ගැනීමේදී වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් ඇතිවීමේ අවදානම් හඳුනාගැනීම හා තක්සේරු කිරීම සඳහා අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලැසුම් කර ක්‍රියාත්මක කරන ලදී. වරදවා දැක්වීම හේතුවෙන් සිදුවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් සිදුවන බලපෑමට වඩා වංචාවකින් සිදුවන්නා වූ බලපෑම ප්‍රබල වන්නේ ඒවා දුස්සන්ධානය, ව්‍යාජ ලේඛන සැකසීමෙන්, චේතනාන්විත මඟහැරීමෙන්, වරදවා දැක්වීමෙන් හෝ අභ්‍යන්තර පාලනයන් මඟ හැරීමෙන් වැනි හේතු නිසා වන බැවිනි.

- අභ්‍යන්තර පාලනයේ සඵලදායිත්වය පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීමේ අදහසින් නොවුවද, අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලසුම් කිරීම පිණිස අභ්‍යන්තර පාලනය පිළිබඳව අවබෝධයක් ලබා ගන්නා ලදී.

- හෙළිදරව් කිරීම් ඇතුළත් මූල්‍ය ප්‍රකාශනවල ව්‍යුහය සහ අන්තර්ගතය සඳහා පාදක වූ ගනුදෙනු හා සිද්ධීන් උචිත සහ සාධාරණ අයුරින් මූල්‍ය ප්‍රකාශනවල ඇතුළත් බව ඇගැයීම.

- මූල්‍ය ප්‍රකාශනවල ව්‍යුහය හා අන්තර්ගතය සඳහා පාදක වු ගනුදෙනු හා සිද්ධීන් උචිත හා සාධාරණව ඇතුළත් වී ඇති බව සහ හෙළිදරව් කිරීම ඇතුළත් මූල්‍ය ප්‍රකාශනවල සමස්ථ ඉදිරිපත් කිරීම අගයන ලදී.

මාගේ විගණනය තුළදී හඳුනාගත් වැදගත් විගණන සොයාගැනීම්, ප්‍රධාන අභ්‍යන්තර පාලන දුර්වලතා හා අනෙකුත් කරුණු පිළිබඳව ගණන්දීමේ නිලධාරී දැනුවත් කරන ලදී.

## 1.5 වෙනත් නෛතික අවශ්‍යතා පිළිබඳ වාර්තාව

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 6(1) (ඈ) වගන්තිය ප්‍රකාරව පහත සඳහන් කරුණු මා ප්‍රකාශ කරමි.

(අ) මූල්‍ය ප්‍රකාශන ඉකුත් වර්ෂය සමඟ අනුරූප වන බවට,

(ආ) ඉකුත් වර්ෂයට අදාළ මූල්‍ය ප්‍රකාශන පිළිබඳව මා විසින් කර තිබුණු නිර්දේශ ක්‍රියාත්මක කර තිබුණි.

## 2. මූල්‍ය සමාලෝචනය

### 2.1 වියදම් කළමනාකරණය

| විගණන නිරීක්ෂණය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| වැය විෂයය අංක 329-1-1-2103 සඳහා මූලික ඇස්තමේන්තුගත ප්‍රතිපාදනය වූ රු.1,800,000 ක මුදලින් රු.1,200,000 ක් හෙවත් සියයට 67 ක ප්‍රමාණයකින් ප්‍රතිපාදන අඩු කර තිබුණු අතර, එම මුදල, සමාලෝචිත වර්ෂයේ මූලික ඇස්තමේන්තු ප්‍රතිපාදන සලසාගෙන නොතිබුණ අංක 329-1-1-2106 - මෘදුකාංග සංවර්ධනය වැය විෂයයට මුදල් රෙගුලාසි මඟින් මාරුකරගෙන තිබුණි. | රාජ්‍ය වියදම් පාලනය කිරීම සම්බන්ධව 2022.04.26 දිනැති ජාතික අයවැය චක්‍රලේඛ 03/2022 මගින් ප්‍රාග්ධන මිලදී ගැනීම් සීමා කිරීම හේතුවෙන් වැය විෂයය අංක 329-1-1-2103 යටතේ වෙන්වූ ප්‍රතිපාදන වලින් ඉතිරිවූ ප්‍රතිපාදන රු. 1,200,000 අවශ්‍යතාවය මත වැය විෂයය අංක 329-1-1-2106 මෘදුකාංග සංවර්ධනය සඳහා මාරු කරන ලදි.<br><br>එසේම වැය ශිර්ෂ අංක 329-1-1-2016 මෘදුකාංග සංවර්ධනය යටතේ 2022 වසරට අදාලව අයවැය ඇස්තමේන්තු සකස්කරන අවස්ථාවේ ප්‍රතිපාදන අවශ්‍යතාවයක් ඇති නොවූ බැවින් ඒ සඳහා අවශ්‍ය ප්‍රතිපාදන උක්ත 329-1-1-2103 යන වැය විෂයෙන් මු.රෙ 66 යටතේ ප්‍රතිපාදන සලසා ගැනිමට කටයුතු කරන ලදි. | මුදල් රෙගුලාසි 50 ප්‍රකාරව ඇස්තමේන්තු පිළියෙල කිරීම නිවැරදිව හා තාත්ත්විකව සිදු කළ යුතු වීම. |

### 2.2 බැරකම් හා බැඳීම්වලට එළඹීම

| විගණන නිරීක්ෂණය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| භාණ්ඩාගාර පත්‍රිකා අංක SA92 අනුව දෙසැම්බර් 31 දිනට දෙපාර්තමේන්තුවේ වැය විෂයයන් 02 කට අදාළ බැරකම් වශයෙන් දක්වා තිබූ එකතුව වූ රු.375,107 ක බැරකම් මූල්‍ය ප්‍රකාශනවල ඇමුණුම iii හි ඇතුළත් බැරකම් ප්‍රකාශයේ දක්වා නොතිබුණි. | මෙම දෝෂය ඉදිරියෙදි සිදු නොවීමට වග බලා ගැනිම සඳහා අදාල නිලධාරින්ට උපදෙස් ලබා දෙන ලදි. | සමාලෝචිත වර්ෂයට අදාළ බැරකම්, මූල්‍ය ප්‍රකාශනවල බැරකම් ප්‍රකාශයේ දැක්වීමට කටයුතු කළ යුතු වීම. |

**2.3 නීති, රීති හා රෙගුලාසිවලට අනුකූල නොවීම**

| විගණන නිරීක්ෂණය | | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| **නීති, රීති හා රෙගුලාසිය** | **අනුකූල නොවීම** | | |
| මුදල් රෙගුලාසි 880 | දෙපාර්තමේන්තුවේ ඇප තැබිය යුතු නිලධාරීන් විසින් ඇප තැන්පත් කර නොතිබුණු බව නිරීක්ෂණය විය. | නිලධාරින්ගේ ඇප තැන්පතු ලබාගැනීමට අවශ්‍ය නීතිමය රෙගුලාසි තහවුරු කර ගැනීමෙන් පසු අදාල පියවර ගැනිමට කටයුතු කරමි. | මුදල් රෙගුලාසි ප්‍රකාරව කටයුතු කළ යුතු වීම |

**3. මෙහෙයුම් සමාලෝචනය**

**3.1 කාර්යසාධනය**

**3.1.1 කාර්යභාරයන් ඉටු නොකිරීම**

**පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.**

| | විගණන නිරීක්ෂණය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| | අමාත්‍ය මණ්ඩලය විසින් 2012 වර්ෂයේදී ගනු ලැබූ තීරණයකට අනුව මුදල් අමාත්‍යාංශය යටතේ තොරතුරු තාක්ෂණ කළමනාකරණ දෙපාර්තමේන්තුව ස්ථාපනය කර තිබුණි. මහා භාණ්ඩාගාරයේ/ මුදල් අමාත්‍යාංශයේ සියලුම දෙපාර්තමේන්තු ස්වයංක්‍රීයකරණය කිරීම දෙපාර්තමේන්තුවේ ප්‍රධාන වගකීමක් ලෙස හඳුනාගෙන තිබූ අතර, මහා භාණ්ඩාගාරයේ සහ මුදල් අමාත්‍යාංශයේ තොරතුරු තාක්ෂණ පද්ධති සැලසුම් කිරීම, සංවර්ධනය කිරීම හා නඩත්තු කිරීම දෙපාර්තමේන්තුව වෙත පැවරී තිබුණි. ඒ අනුව, සමාලෝචිත වර්ෂයේදී දෙපාර්තමේන්තුව විසින් මහා භාණ්ඩාගාරය/ මුදල් අමාත්‍යාංශය යටතේ වන දෙපාර්තමේන්තු සඳහා තොරතුරු තාක්ෂණ පද්ධති සංවර්ධනය කිරීම පිළිබඳ පහත සඳහන් කරුණු නිරීක්ෂණය විය. | | |
| (අ) | රජයේ සේවකයින්ට කාර්යක්ෂමව හා ඵලදායී ලෙස වැටුප් ගෙවීම සඳහා භාණ්ඩාගාරයේ දෙපාර්තමේන්තුවල වැටුප් ගෙවීම් පද්ධතිය පුළුල් කිරීමේ අරමුණින් නව ඊ වැටුප් පද්ධතිය | E වැටුප් පද්ධතිය සජීව ධාවන තත්ත්වයට සුදුසු අයුරින් සකස් කර ඇති අතර, මෙම පද්ධතිය සජීවී | පද්ධතිය සජීවී ධාවන තත්ත්වයට පත් කිරීමට කටයුතු කළ යුතු වීම. |

| | | | |
|---|---|---|---|
| | හඳුන්වා දී තිබුණු අතර, 2023 අප්‍රේල් 30 දින වන විටත් දෙපාර්තමේන්තු තුළ පද්ධතිය සජීවී ධාවන තත්ත්වයට පත් වී නොතිබුණු බව නිරීක්ෂණය විය. | ධාවනය සඳහා වන වගකීම් රාජ්‍ය ගිණුම් දෙපාර්තමේන්තුව මගින් සිදු කරනු ලබයි. | |
| (ආ) | රජයේ නිලධාරීන්ට තීරු බදු රහිතව වාහන ආනයනය කිරීමේ අයදුම්පත් මාර්ගගතව යොමු කිරීමේ පද්ධතියේ නව සංවර්ධනයක් සිදුකොට, පද්ධතියේ සමස්ත පරීක්ෂාව සිදුකර අවසානයේ මුල් අදියර වශයෙන් මුදල් අමාත්‍යාංශය තුළ පවතින දෙපාර්තමේන්තු කිහිපයක පද්ධතිය ධාවනය කිරීමට අපේක්ෂිත බව විගණනය වෙත දන්වා තිබුණද, එය 2023 අප්‍රේල් 30 දින වන විටත් විධිමත් පරිදි ක්‍රියාත්මක තත්ත්වයේ නොතිබුණි. | පද්ධතිය ක්‍රියාත්මක කරගෙන යන අතරතුර හඳුනා ගන්නා නව අවශ්‍යතා සංවර්ධනය කර යාවත්කාලීන කිරීම අප දෙපාර්තමේන්තුවේ නිලධාරීන් විසින් තව දුරටත් සිදු කරනු ලබයි. | පද්ධතියට අයත් අනෙකුත් මොඩියුල ද සංවර්ධනය කර පද්ධතිය ධාවනය කරවීමට කටයුතු කළ යුතු වීම. |
| (ඇ) | මුදල් අමාත්‍යාංශයේ ප්‍රවාහන ඒකකයේ තොරතුරු පද්ධතිය සංවර්ධනය සඳහා ස්ථාපිත පද්ධති සංවර්ධන ක්‍රියාවලිය ක්‍රියාත්මක තත්ත්වයේ තිබුණද, 2023 අප්‍රේල් 30 දින වන විටත් එම පද්ධතිය භාවිතයේ නොතිබුණි. | ප්‍රවාහන ඒකකය වෙත සංවර්ධනය කරන ලද තොරතුරු පද්ධතිය සඳහා අප දෙපාර්තමේන්තුව මගින් සිදුකළ යුතු සියළුම කාර්යයන් අවසන් කර ඇති බැවින් ඉදිරි කටයුතු ක්‍රියාත්මක කර ගෙන යාම ප්‍රවාහන ඒකකය මගින් සිදුකල යුතුවේ. | පද්ධතිය භාවිතා කරවීමට කටයුතු කළ යුතු වීම. |

## 4. මානව සම්පත් කළමනාකරණය

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

| | විගණන නිරීක්ෂණය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | දෙපාර්තමේන්තුවේ අනුමත තනතුරු 57 ක් වූ අතර, ඉන් තනතුරු 10 ක් පුරප්පාඩුව පැවතුණි. එම පුරප්පාඩු තනතුරු අතර, ජ්‍යෙෂ්ඨ මට්ටමේ තනතුරු 03 ක් ද තෘතියික මට්ටමේ තනතුරු 01 ක් ද, ද්විතීයික මට්ටමේ තනතුරු 05 ක් සහ ප්‍රාථමික මට්ටමේ තනතුරු 01 ක් ද විය. | අදහස් දක්වා නොමැත. | විධිමත් පරිදි කටයුතු කර පුරප්පාඩු පිරවීම හෝ අනුමත සේවක සංඛ්‍යාව සංශෝධනයට පියවර ගත යුතු වීම |
| (ආ) | ඉ-රාජ්‍ය සේවා (E-Governance) සංකල්පය සාක්ෂාත් කර ගැනීම සඳහා තොරතුරු සන්නිවේදන තාක්ෂණ | තොරතුරු හා සන්නිවේදන තාක්ෂණ නිලධාරි සහ තොරතුරු හා සන්නිවේදන | අදාල සුදුසුකම් සහිත නිලධාරීන් බඳවා ගැනීමට කටයුතු කළ |

| | | |
|---|---|---|
| කටයුතු සම්බන්ධීකරණය කිරීම දෙපාර්තමේන්තුවේ ප්‍රධාන අරමුණක් ලෙස හඳුනාගෙන තිබුණ ද, ඉ-සේවා ක්‍රියාත්මක කිරිම සඳහා අවශ්‍ය වන දක්ෂතාවයන් හා කුසලතාවයන්ගෙන් හෙබි තාක්ෂණික කාර්ය මණ්ඩලයේ හිඟය දෙපාර්තමේන්තුවේ අභියෝගයක් ලෙස 2020 වර්ෂයේ සිට හඳුනාගෙන තිබුණ ද, සමාලෝචිත වර්ෂය අවසන් වන විටත් එම අභියෝගය ජයගත් බව තහවුරු වන සාක්ෂි විගණනයට නිරීක්ෂණය නොවීය. | තාක්ෂණ සහකාර නිලධාරීන් පුරප්පාඩු පිළිබඳව රාජ්‍ය පරිපාලන, ස්වදේශ කටයුතු පළාත් සභා හා පළාත් පාලන අමාත්‍යාංශය වෙත දැනුම් දී ඇත. | යුතු වීම. |